## ශ්‍රී ලංකා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (SL-GAP) සහතිකකරණය

## අයදුම් පත්‍රය පිරවීම සඳහා වන උපදෙස් පත්‍රිකාව

**අයදුම් පත්‍රය අනු අංක 01 සිට 34 දක්වා සමන්විත වේ. එම සියළුම ප්‍රශ්න සඳහා අනිවාර්යයෙන් තොරතුරු සැපයිය යුතුය.**

**අයදුම්කරුගේ නම** : සම්පූර්ණ නම සඳහන් කළ යුතුය.

**දිස්ත්‍රික්කය** : ගොවිපොළ පිහිටි දිස්ත්‍රික්කය සඳහන් කළ යුතුය.

1. **ගොවිපොළ පිළිබඳ සාමාන්‍ය තොරතුරු**

**ගොවිපොළෙහි නම සහ ලිපිනය -** ව්‍යාපාරික කටයුතු සඳහා ලියාපදිංචි කොට ඇත්නම් පමණක් ගොවිපොළෙහි නම ලෙස එම නම යොදන්න, ගොවිපොළ පිහිටි ලිපිනය සඳහන් කරන්න.

**අයදුම්කරුගේ තැපැල් ලිපිනය -** අයදුම්කරුට තැපෑලෙන් ලිපි ලැබෙන ලිපිනය සඳහන් කරන්න.

**දුරකථන අංකය -** අයදුම්කරු සම්බන්ධ කර ගත හැකි ස්ථාවර හා ජංගම දුරකථන අංක සඳහන් කරන්න. (ඊ මේල්, ෆැක්ස්, වෙබ් ලිපිනය ඇත්නම් සඳහන් කරන්න)

**මුලකුරු සමඟ නම සහ ලිපිනය -** SL-GAP සහතික පත්‍රය මත මුද්‍රණය කළ යුතු වගාකරුගේ නම හා **ගොවිපොළෙහි ලිපිනය** ඉතා නිවැරදිව ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න

2. මින් පෙර SL-GAP සහතිකකරණය සඳහා අයදුම් කර තිබේ නම් අදාල කොටුව තුල ✓ලකුණ යොදන්න. SL-GAP **සහතිකය ලබා තිබේ නම් එහි අංකය** (ඉලක්කම් 13 කින් යුතු අංකය) සඳහන් කරන්න.

4. දැනටමත් ඔබේ ගොවිපොළ වෙනත් කිනම් හෝ සහතිකකරණයක් ලබා තිබේ නම් (ග්ලෝබල් ගැප්,කාබනික සහතිකකරණය වැනි වෙනත් සහතිකකරණයක්) අදාල කොටුව තුල ✓ ලකුණ යොදන්න. ඔව් නම් එම සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න.

5. දැනට SL-GAP සහතිකකරණය සඳහා භාවිතා කරන (SLS 1523 Part 1, 2016) ප්‍රමිතියට අදාල කරුණු පිළිබඳ ඔබ දැනුවත් නම් අදාල කොටුව තුල ✓ ලකුණ යොදන්න.

6. SL-GAP අනුව සැකසූ පොත් පත් හෝ විස්තර පත්‍රිකා ඔබ සතුව ඇත්නම් අදාල කොටුව තුල ✓ ලකුණ යොදන්න.

7. SL-GAP ප්‍රමිතියට අනුව සැකසූ ගොවිපොළ පිරික්සුම් ලැයිස්තුවක් ඔබ සතුව ඇත්නම් අදාල කොටුව තුල ✓ ලකුණ යොදන්න.(ඔබගේ ගොවිපොළ ස්වයං අධීක්ෂණයක් කර අඩු පාඩු සකසා ගැනීමට)

8. SL-GAP සහතිකකරණය සඳහා අයදුම් කරන දින සිට අවම වශයෙන් ඉදිරි වර්ෂයක කාලයකට අදාලව ගොවිපොළ තුල වගා කළ හා වගා කිරීමට අපේක්ෂිත බෝග ඇතුලත් කළ බෝග වගා සැලැස්ම, පොහොර කළමනාකරණ සැලැස්ම හා අවධානම් කළමනාකරණ සැලැස්ම (රෝග හා පලිබෝධ) යන සියළු තොරතුරු ඇතුලත් කළ ගොවිපොළ තත්ත්ව කළමනාකරණ සැලැස්මක් ඔබගේ ගොවිපොළ සඳහා සකසා ඇත්නම් අදාල කොටුව තුල ✓ ලකුණ යොදන්න.

9. SL-GAP අයදුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේදී ගොවිපොළෙහි මෙම කන්නයේ වගා කර ඇති බෝග හා ප්‍රභේදය, අදාල ඉඩම් කොටසේ අංකය/සලකුණ හා වපසරිය ඇතුලත් කළ යුතු අතර ඉදිරි කන්නයේ සහතිකකරණය සඳහා අවශ්‍ය බෝගය හෝ බෝග සඳහාද එම තොරතුරු ඇතුලත් කරන්න. මෙම වගුවෙහි ඇතුලත් කළ නොහැකි ලෙස අමතර බෝග ඇත්නම් ඇමුණුමක් ලෙස ඉදිරිපත් කරන්න.

13. ගොවිපොළ තුල බහුලව දක්නට ලැබෙනුයේ වැලි, මැටි හෝ ලෝම පස් ද යන්න හා හැකිනම් පස් වර්ගයේ නම් සඳහන් කරන්න.

16. පාංශු සාරවත් බව වැඩි කිරීමට කොම්පෝස්ට් පොහොර පසට එක් කළේ නම් අදාල කොටුව තුල ✓ ලකුණ යොදන්න. කොම්පෝස්ට් සකස් කිරීමට යොදාගත් මූලාශ්‍ර සහ සකසා ගන්නා ලද්දේ ගොවිපළ තුල ද, ගොවිපොළෙන් පිටත ද යන්න තවදුරටත් සඳහන් කරන්න. ගොවිපොළෙන් පිටත සැකසූ කොම්පොස්ට් භාවිතා කළේ නම් සපයාගත් ස්ථානයේ නම හා ලිපිනය සඳහන් කරන්න.

19. ජල සම්පාදන කටයුතු සඳහා යොදා ගන්නා ජලයේ ගුණාත්මය පරීක්ෂා කිරීම සඳහා ජලයේ ක්ෂුද්‍ර ජීවී ප්‍රතිශතය හෝ රසායනික ද්‍රව්‍ය ඇති නැති බව පිළිබඳ වාර්තාවක් ලබාගෙන ඇත්නම් අදාල කොටුව තුල ✓ ලකුණ යොදන්න. 'ඔව්' නම් කොපමණ කාලයකට වරක් ජලය පරීක්ෂා කරන්නේදැයි සඳහන් කරන්න.

21. මෙයට පෙර ඔබගේ ගොවිපොළ භූමිය කෘෂිකාර්මික නොවන කටයුතු සඳහා භාවිතා කර ඇත්නම් 'ඔව්' ලෙස සටහන් කර ඒ කුමන ක්‍රියාව සඳහා ද යන්න සඳහන් කරන්න. SL-GAP අයදුම්පත ඉදිරිපත් කරන දින සිට ආසන්න පූර්ව වසර 2ක කාලයක් තුල ක්ෂේත්‍රයේ වගා කරන ලද බෝග සඳහන් කරන්න.

23. SL-GAP අයදුම්පත ඉදිරිපත් කරන දින සිට ඉදිරි වසරක කාලයකට අදාලව දැනට ක්ෂේත්‍රයේ වගා කර ඇති හා වගා කිරීමට බලාපොරොත්තු වන සියළුම බෝග සඳහා විශේෂයෙන් හඳුනාගත් **පළිබෝධ** පාලනය සඳහා මෙන්ම **රෝග** පාලනය සඳහා යොදාගන්නා ක්‍රමවේද පිළිබඳ අදාළ විස්තර වෙන් වෙන් වශයෙන් වගු දෙකෙහි සඳහන් කරන්න.

24. ඔබගේ වගා භූමිය තුල යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (SL-GAP) යටතේ හා සම්ප්‍රදායික ක්‍රමවේදයට යන ආකාර දෙකෙන්ම වගාකර තිබේනම් 'ඔව්' යැයි සඳහන් කර එම නිෂ්පාදන වෙන් වෙන් ව වෙළඳපොළට සැපයීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග සඳහන් කරන්න.

25. ගොවිපොළට යාබද භූමි වල සිදු කරන විවිධ ක්‍රියාකාරකම් නිසා ඔබගේ ගොවිපොළෙහි කෘෂි නිෂ්පාදන වලට රසායනික, ජීවී හා භෞතික දූෂක එකතු වීමක් සිදු වීමට ඉඩ ඇත්නම් අදාල කොටුව තුල ✓ ලකුණ යොදන්න. පිළිතුර 'ඔව්' විට එම දූෂක එකතුවීමේ අවධානම අවම කිරීමට අදාල ක්‍රියාමාර්ග ගෙන තිබේ නම් පමණක් අදාල කොටුව තුල ✓ ලකුණ යොදන්න.

26. අස්වනු නෙලීමේදී හා තාවකාලිකව ගබඩා කිරීමේදී යොදා ගන්නා උපකරණ, කූඩ, යොදා ගන්නා බිම් ඇතුරුම්, ගෝනි හෝ සතුන් මඟින් කෘෂි නිෂ්පාදන දූෂ්‍ය නොවීම සඳහා ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත්නම් අදාල කොටුව තුල ✓ ලකුණ යොදන්න.

27. ඔබගේ ගොවිපොළ තුල අස්වනු නෙලීමෙන් අනතුරුව අස්වනු සේදීමකට ලක්කරන්නේ නම් අදාල කොටුව තුල ✓ ලකුණ යොදන්න. පිළිතුර 'ඔව්' නම් භාවිතා කළ ජලය පානීය තත්ත්වයෙන් පවතී නම් අදාල කොටුව තුල ✓ ලකුණ යොදන්න. ජලය පරීක්ෂා කළ සහතිකය අමුණන්න.

30. ඔබගේ ගොවිපොළෙහි ගබඩා ස්ථානයේ ඇති කෘෂි නිෂ්පාදන කෘමීන් හා වෙනත් සතුන්ගෙන් හානි නොවන සේ ආරක්ෂා කිරීමට පියවර ගෙන තිබේද යන්න මෙහිදී විමසා ඇත.

32. පොහොර සහ පළිබෝධනාශක ගබඩා කිරීමේදී ඒවායේ ගුණාත්මයට හානි නොවන ලෙස ගබඩාවේ තැන්පත් කොට ඇති ආකාරය, ඒවා මතට කෙලින්ම සූර්යාලෝකය නොවැටෙන ලෙස හා වාතාශ්‍රය ලැබෙන පරිදි, වර්ග අනුව ලේබල් කර තිබීම හා දියර ආකාරයේ ඒවාට ඉහලින් කුඩු ආකාරයේ ඒවා ගබඩා කර තිබීම වැනි කරුණු සලකා බැලේ.

33. සේවකයන් සඳහා යහපත් කෘෂි පිළිවෙත් අනුගමනය, නැවුම් එළවළු හා පළතුරු හැසිරවීම, පළිබෝධනාශක යෙදීම ආදී පුහුණු ලබා දී තිබේද යන්න මෙහිදී විමසා ඇත.

**බෝග සැලැස්ම** : SL-GAP අයදුම්පත ඉදිරිපත් කරන දින සිට ඉදිරියට වසරක් සඳහා වූ බෝග සැලැස්ම පහත සපයා ඇති ආකෘතියට අනුව සකස් කර අයදුම්පත සමඟ අමුණා එවන්න.

| බෝග | කට්ටි අංකය | වපසරිය (අක්.) | අපේක්ෂිත අස්වැන්න (කි.ග්‍රෑ.) | බෝග සැලැස්ම; වසර ........................................ සිට ........................................ දක්වා | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ජන | | පෙබ | | මාර් | | අප්‍රේ | | මැයි | | ජූනි | | ජූලි | | අගෝ | | සැප් | | ඔක් | | නොවැ | | දෙසැ | | ජන | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |

නිර්දේශය :- ඔබගේ ගොවිපොළ සඳහා අභ්‍යන්තර විගණනය සිදුකර නිර්දේශ ලබා දීමට හා අභ්‍යන්තර විගණන ලැයිස්තුව ඉදිරිපත් කිරීමට